සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

117374

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## පුරවැසි අධ්‍යාපනය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** යම්කිසි ගැටුමක් සාකච්ඡා ක්‍රමය මගින් විසඳාගැනීමට අපොහොසත් වන විට යොදාගත හැකි ගැටුම් නිරාකරණ ක්‍රමයක් වන්නේ
(1) සහමන්ත්‍රණයයි. (2) කේවල් කිරීමයි.
(3) බේරුම් කිරීමයි. (4) මැදිහත්කරණයයි.

**2.** පාරිභෝගික භාණ්ඩ යුගලයක් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) ආහාර සහ පොහොර (2) ඇඳුම් පැළඳුම් සහ ඖෂධ
(3) ගෘහ භාණ්ඩ සහ යන්ත්‍ර සූත්‍ර (4) ගොඩනැගිලි සහ රථ වාහන

**3.** පාර්ලිමේන්තු මැතිවරණයකට අදාළ ඡන්ද පෙත්සම් විභාග කිරීමට බලය ඇති අධිකරණ ආයතනය කුමක් ද?
(1) ශ්‍රේෂ්ඨාධිකරණය (2) මහාධිකරණය
(3) අභියාචනාධිකරණය (4) දිසා අධිකරණය

**4.** 2025 වර්ෂයේ නොවැම්බර් මාසයේ ලංකාවේ බොහෝ ප්‍රදේශවලට හානි සිදු කරමින් හමාගිය සුළි සුළඟේ නම කුමක් ද?
(1) දිට්වා (2) ඩෙක්ස්ටර් (3) සෙබෙස්ටියන් (4) පැබ්ලෝ

**5.** විවිධ ආගම්, භාෂා සහ ජන වර්ගවලට අයත් පුද්ගලයන් එකට එක්ව ජීවත්වීම හඳුන්වන්නේ
(1) බහුවාර්ගික සමාජයක් ලෙසට ය. (2) බහු භාෂා සමාජයක් ලෙසට ය.
(3) බහු ආගමික සමාජයක් ලෙසට ය. (4) බහු සංස්කෘතික සමාජයක් ලෙසට ය.

**6.** පුද්ගලයකු ලෙස මෙලොවට බිහිවීම නිසා උපතින් ම පොදුවේ සියලුදෙනාට ම ලැබෙන අයිතිවාසිකම් හඳුන්වන නම කුමක් ද?
(1) මානව අයිතිවාසිකම් (2) දේශපාලන අයිතිවාසිකම්
(3) පුරවැසි අයිතිවාසිකම් (4) ආගමික අයිතිවාසිකම්

**7.** බහු සංස්කෘතික ජන සමාජයක යහපැවැත්ම සඳහා වැදගත් වන ගුණාංගයක් වන්නේ
(1) නායකත්වයට ගරු කිරීමයි. (2) නීතිරීතිවලට අවනත වීමයි.
(3) සිරිත් විරිත් අනුගමනය කිරීමයි. (4) සාමූහිකත්වය වර්ධනය කිරීමයි.

**8.** යම් පුද්ගලයකුගේ ජීවිතයට හෝ දේපළවලට හානි සිදු කළ අවස්ථාවක ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන නීතිය කුමක් ද?
(1) සිවිල් නීතිය (2) අපරාධ නීතිය (3) දණ්ඩ නීතිය (4) දේශීය නීතිය

[දෙවැනි පිටුව බලන්න.

**9.** ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථාවක් වන්නේ පහත කුමන ක්‍රියාවක් ද?
(1) පාසල් යා යුතු වයසේ දරුවන් පාසල්වලට නොයැවීම
(2) ළමයින් සඳහා ජීවිත රක්ෂණ ආවරණ ලබා නොදීම
(3) ගැහැනු ළමුන්ගේ ආරක්ෂාවට පියවර නොගැනීම
(4) ළමා කාලය තුළ විනෝද වීමට අවස්ථා ලබා නොදීම

**10.** ව්‍යවස්ථාදායකය මගින් පනවනු ලබන නීති ක්‍රියාවට නංවන ආයතනය වන්නේ
(1) ශ්‍රේෂ්ඨාධිකරණයයි. (2) විධායකයයි.
(3) අගමැති කාර්යාලයයි. (4) පාර්ලිමේන්තුවයි.

**11.** මිනිසාගේ මූලික ආර්ථික ප්‍රශ්න ඇති වීමට බලපාන සාධකය මින් කුමක් ද?
(1) සම්පත් අසීමිතව පැවතීම (2) සම්පත් සීමිතව පැවතීම
(3) සම්පත් විෂමව පැවතීම (4) සම්පත් අස්ථාවරව පැවතීම

**12.** වර්තමානයේ ශ්‍රී ලාංකිකයන් සඳහා ඉහළ ම රැකියා වෙළඳපොළක් නිර්මාණය කර දී ඇති රට කුමක් ද?
(1) දකුණු කොරියාව (2) ඉන්දියාව (3) යුක්රේනය (4) ඕස්ට්‍රේලියාව

**13.** මැතිවරණයක දී ජනතා හිතවාදී ආණ්ඩුවක් පත් කර ගැනීමේ වැදගත්ම වගකීම හිමි වන්නේ මින් කවරෙකුට ද?
(1) ජනාධිපතිවරයාට (2) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට
(3) විපක්ෂ නායකවරයාට (4) ඡන්දදායකයාට

**14.** සන්ධීය ආණ්ඩු ක්‍රමයක දක්නට ලැබෙන **අයහපත්** ලක්ෂණයක් වන්නේ
(1) මධ්‍යම ආණ්ඩුව වෙතින් ප්‍රාන්ත ආණ්ඩු වෙන්වීමට උත්සාහ කිරීමයි.
(2) ප්‍රජාතන්ත්‍රවාදී පාලන මූලධර්ම ශක්තිමත් කිරීමයි.
(3) පරිපාලන තීරණ ගැනීමේ දී නිලධාරීන් නොමැති වීමයි.
(4) අත්තනෝමතිකව රාජ්‍ය පාලනය කිරීමට බාධා කිරීමයි.

**15.** නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යටතේ රටක පාලනය සඳහා නියෝජිතයන් තෝරා ගන්නා ක්‍රමය කුමක් ද?
(1) ජාතීන්ගේ අනුපාතය අනුව (2) සර්වජන ඡන්ද බලයෙන්
(3) පාලකයාට අභිමතය පරිදි (4) දේශපාලන පක්ෂ අනුව

**16.** රාජ්‍යය පිළිබඳ පහත දැක්වෙන අදහස් අතුරෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) රාජ්‍යය ස්ථාවර ආයතනයක් වේ.
(2) රාජ්‍යයට නිශ්චිත භූමි ප්‍රමාණයක් ඇත.
(3) රාජ්‍යය වරින්වර වෙනස් විය හැකි ය.
(4) රාජ්‍යය තුළ නිශ්චිත ජනගහනයක් ඇත.

**17.** ධනවාදී වෙළඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන රටවල් යුගලයක් වන්නේ,
(1) ඉන්දියාව සහ වෙනිසියුලාවයි. (2) දකුණු කොරියාව සහ උතුරු කොරියාවයි.
(3) මහා බ්‍රිතාන්‍යය සහ රුසියාවයි. (4) ඕස්ට්‍රේලියාව සහ සිංගප්පූරුවයි.

**18.** පාසල් පරිසරය තුළ ගැටුම් අවම කිරීමට ශිෂ්‍යයන්ට ගත හැකි වඩාත් ඵලදායී පියවරක් වන්නේ
(1) සියලු සිසුන් සමග සබඳතා ඇති කර ගැනීමයි.
(2) පාසලේ නීතිරීතිවලට අවනතව කටයුතු කිරීමයි.
(3) ගැටුම් නොසලකා පන්ති කාමරය තුළ රැඳී සිටීමයි.
(4) ගැටුම් ඇතිවන අවස්ථා ගුරුවරුන්ගෙන් වසන් කිරීමයි.

**19.** රටේ ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාමට සහාය වීම යටතේ පුරවැසියාගෙන් මධ්‍යම ආණ්ඩුවට ඉටු විය යුතු වගකීමක් වන්නේ
(1) විවිධ අහිතකර ද්‍රව්‍ය පරිසරයට මුදාහැරීමෙන් වැළකීමයි.
(2) ස්වාභාවික පරිසරය ආරක්ෂා කර ගැනීමට දායක වීමයි.
(3) ප්‍රාදේශීය සංවර්ධනයට ක්‍රියාකාරීව දායකත්වය ලබාදීමයි.
(4) අල්ලස, දූෂණය, නාස්තිය සහ වංචාව පිටු දැකීමට ක්‍රියා කිරීමයි.

**20.** රටක යහපාලනයේ දී ආර්ථික අනන්‍යතාවට ගරු කිරීමේ පියවරක් ලෙස සැලකෙන්නේ
(1) නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීමයි. (2) තමන් කැමති ප්‍රදේශයක පදිංචි වීමයි.
(3) යටිතල පහසුකම් සංවර්ධනය කිරීමයි. (4) විවිධ උත්සව සංවිධානය කිරීමයි.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**21.** ජාත්‍යන්තර සබඳතා පවත්වා ගැනීම මගින් රටකට ලබාගත හැකි වාසියක් වන්නේ කුමක් ද?
(1) රාජ්‍ය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම
(2) බහු සංස්කෘතික අධ්‍යාපනයක් ක්‍රියාත්මක කිරීම
(3) මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීමට පහසු වීම
(4) ප්‍රබල රාජ්‍යයන්ගේ බලපෑම්වලින් ආරක්ෂා වීම

**22.** පරිසර පද්ධතිය සකස් වී ඇති සංරචක අතුරෙන් භෞතික නොවන පරිසරයට අයත් වන සංරචකයක් වන්නේ
(1) ස්වාභාවික පරිසරයයි. (2) ජෛව පරිසරයයි.
(3) සමාජ පරිසරයයි. (4) දේශගුණික පරිසරයයි.

**23.** අධිකරණය ස්වාධීන හා අපක්ෂපාතී වන විට ඇතිවන වාසියක් වන්නේ
(1) පුද්ගලයන් නීතිගරුකව ජීවත් වීමට පෙළඹීමයි.
(2) විනිශ්චයකරුවන්ට තීන්දු ගැනීමට පහසු වීමයි.
(3) නීතිය පිළිබඳ පුද්ගලයන්ට අවබෝධයක් ලැබීමයි.
(4) සේව්‍ය සේවක කණ්ඩායම් අතර ගැටුම් අවම වීමයි.

**24.** ගැටුම් නිරාකරණය කිරීමේ දී සමථකරු ඒ සඳහා යොමු වන්නේ
(1) අධිකරණයේ ඉල්ලීම මතයි. (2) පොලිසියේ ඉල්ලීම මතයි.
(3) එක් පාර්ශ්වයකගේ ඉල්ලීම මතයි. (4) මැදිහත්කරුගේ ඉල්ලීම මතයි.

**25.** ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජයක් බිහිවීමට බලපෑ ආක්‍රමණයක් ලෙස සැලකිය හැකි වන්නේ පහත සඳහන් කුමන කණ්ඩායමකගේ පැමිණීම ද?
(1) විජය ඇතුළු පිරිස (2) කාලිංග මාඝ ඇතුළු පිරිස
(3) පඬුවස් දෙව් ඇතුළු පිරිස (4) මිහිඳු හිමියන් ඇතුළු පිරිස

**26.** ආණ්ඩුව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පනත් සලකා බලා අවශ්‍ය නීතිමය උපදෙස් ලබාදීමේ වගකීම හිමි වන්නේ
(1) අධිකරණ ඇමතිවරයාට ය. (2) නීතිපතිවරයාට ය.
(3) අගවිනිසුරුවරයාට ය. (4) ඔම්බුඩ්ස්මන්වරයාට ය.

**27.** සංවර්ධනය වන රටවල්වල දක්නට ලැබෙන ලක්ෂණ **පමණක්** ඇතුළත් වරණය කුමක් ද?
(1) ළදරු මරණ අනුපාතය වැඩිවීම සහ ඒක පුද්ගල ආදායම අඩු වීම
(2) ඒක පුද්ගල ආදායම වැඩි වීම සහ තාක්ෂණය භාවිතය අඩු වීම
(3) ආයු අපේක්ෂාව වැඩි වීම සහ පරිගණක සාක්ෂරතාව අඩු වීම
(4) නාගරික ජන සංඛ්‍යාව වැඩි වීම සහ විදේශ විනිමය ඉපයීම් අඩු වීම

**28.** පහත සඳහන් කරුණු අතුරෙන් කම්කරු අයිතිවාසිකමක් වන්නේ කුමක් ද?
(1) සේව්‍ය සේවක අන්තර්පුද්ගල සබඳතා යහපත් වීම
(2) සේවක ඵලදායිතාව ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම
(3) සේවක අර්ථසාධක අරමුදල් ලාභදායී ව්‍යාපාරවල ආයෝජනය කිරීම
(4) සේවකයාට සාධාරණ වැටුපක් ලැබීමට හිමිකමක් තිබීම

**29.** පුරවැසියකු විසින් තමාට පැවරෙන කාර්යයක් නිවැරදිව ඉටු කිරීම සඳහා ඇති නීත්‍යානුකූල බැඳීම හඳුන්වනු ලබන්නේ
(1) වගකීම ලෙස ය. (2) යුතුකම ලෙස ය. (3) අධිකාරිය ලෙස ය. (4) වගවීම ලෙස ය.

**30.** යහපාලන පාලන ක්‍රමයක මූලික ගුණාංගයක් වන්නේ කුමක් ද?
(1) තමන් කැමති රැකියාවක නිරත වීම (2) තමන් කැමති දේශපාලන මතවාදයක් දැරීම
(3) විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම (4) සර්ව ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**31.** ගෝලීයකරණයට මුහුණ දීම සඳහා මූල්‍ය ගනුදෙනු වඩාත් ක්‍රමවත් කිරීමේ හා නිර්බාධ වෙළඳාම ව්‍යාප්ත කිරීමේ අරමුණින් පිහිටුවා ගත් සංවිධානයක් නම්
(1) යුරෝපා සංගමයයි. (2) කොළඹ ක්‍රමයයි.
(3) බිම්ස්ටෙක් සංවිධානයයි. (4) යුනිසෙෆ් සංවිධානයයි.

**32.** රටවල් අතර නිල මට්ටමේ පුද්ගලයන් මගින් ඇති කරගනු ලබන රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හඳුන්වන නම කුමක් ද?
(1) ආරක්ෂණ උපාය සම්බන්ධතා (2) රාජ්‍ය උපාය සම්බන්ධතා
(3) සංස්කෘතික උපාය සම්බන්ධතා (4) දේශපාලන උපාය සම්බන්ධතා

[හතරවැනි පිටුව බලන්න.

117374

**33.** පහත වරණ අතුරෙන් ශ්‍රී ලංකාවේ බලය බෙදීමට ගත් උත්සාහයක් වන්නේ කුමක් ද?
(1) ප්‍රාදේශීය සභා පිහිටුවීම
(2) මහනගර සභා පිහිටුවීම
(3) දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම
(4) ගම් සභා පිහිටුවීම

**34.** මහජනතාව සතු පරමාධිපත්‍ය බලයට අයත් කොටස් නිවැරදිව දක්වා ඇති වරණය කුමක් ද?
(1) පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය
(2) පාලන බලතල, විධායක බලය, මානව හිමිකම්
(3) පාලන බලතල, සැලසුම්කරණය, කළමනාකරණය
(4) පාලන බලතල, අධිකරණ බලතල, පරිපාලන බලතල

**35.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් පරිසරය පිළිබඳව නිවැරදි අදහසක් ලබාදෙන ප්‍රකාශය තෝරන්න.
(1) මිනිසා විසින් නිර්මාණය කරනු ලබන දේ පරිසරය වේ.
(2) පරිසරය මිනිසුන්ගේ සංස්කෘතික දායාදයක් වේ.
(3) පරිසරය යනු පෘථිවියේ ජීවත්වන සියලු ම මනුෂ්‍යයන් වේ.
(4) ජීවියකු වටා පවතින භෞතික තත්ත්වය පරිසරය වේ.

**36.** පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් යටතේ දේශපාලන විධායකය ලෙස සැලකෙන්නේ මින් කවුද?
(1) විධායක ජනාධිපතිවරයා
(2) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
(3) ව්‍යවස්ථාදායක සභාව
(4) පළාත් ආණ්ඩුකාරවරුන්

**37.** එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් අරමුණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීමේ අයිතියක් ඇති බව
(2) නීති මගින් මානව අයිතිවාසිකම් ආරක්ෂා කර දීම අත්‍යවශ්‍ය බව
(3) පෞද්ගලික රහස්‍ය බව පවත්වා ගැනීමට අයිතියක් ඇති බව
(4) පුද්ගලයකු සතු දේපළ බලෙන් අහිමි කළ නොහැකි බව

**38.** 1989 වර්ෂයේ දී සම්මත කරන ලද සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට එකතු කළ දෙවන වෛකල්පිත සම්මුතියේ ප්‍රධාන අරමුණ කුමක් ද?
(1) ඕනෑම ආගමක් ඇදහීමේ නිදහස ලබාදීම
(2) දේපළ පවත්වා ගැනීමට අයිතිය දීම
(3) මරණ දඬුවම ලබාදීම අහෝසි කිරීම
(4) විදේශගත වීමට ඇති අයිතිය ලබාදීම

**39.** පහත '**අ**' තීරුවෙන් පරිසරයේ විවිධ දූෂණයන් ද '**ආ**' තීරුවෙන් එම නිසා ඇතිවන ගැටලු ද දක්වා ඇත.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. ජලය දූෂණය වීම | A - පාංශු තෙතමනය ඉවත්වීම |
| 2. ශිලාගෝලයට හානි සිදුවීම | B - මුහුදු ජල මට්ටම ඉහළ යාම |
| 3. වන හායනය | C - පරිසර සෞන්දර්ය විනාශ වීම |
| 4. වායු දූෂණය වීම | D - සමාජ දුරාචාර වැඩිවීම |
| | E - ලෙඩරෝග ව්‍යාප්ත වීම |

'**අ**' තීරුවට අනුව '**ආ**' තීරුව පිළිවෙළින් ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?
(1) ABCD (2) BCDE (3) DEBA (4) ECAB

**40.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - නියමිත කාලසීමාව තුළ මැතිවරණ පවත්වනු ලබයි.
B - තරගකාරී පක්ෂ ක්‍රමයක් දක්නට ලැබේ.
C - තරගකාරී වෙළඳපොළ ක්‍රමයක් දක්නට ලැබෙයි.
D - කම්කරු ගැටුම් සමථකරණයෙන් විසඳා ගනියි.
E - අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා වී තිබේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් ප්‍රජාතන්ත්‍රවාදී අංග ලක්ෂණ ඇතුළත් ප්‍රකාශ පමණක් අඩංගු වරණය කුමක් ද?
(1) ABC (2) ABE (3) BCD (4) CDE

* *

PAST PAPERS WIKI

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**62 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

## පුරවැසි අධ්‍යාපනය II

※ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.

※ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) ශ්‍රී ලංකාවට 2025 නොවැම්බර් මාසයේ බලපෑ සුළි සුළං තත්ත්වය නිසා බරපතලම හානි සිදු වූ පළාත් **දෙක** මොනවා ද?

(ii) පුරවැසියකු විසින් සමාජයට ඉටු කළ යුතු සදාචාරාත්මක යුතුකම් **දෙකක්** සඳහන් කරන්න.

(iii) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව බෙදිය හැකි කොටස් **දෙක** මොනවා ද?

(iv) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් ප්‍රධාන ප්‍රතිසංස්කරණ **දෙකක්** සඳහන් කරන්න.

(v) මානව අයිතිවාසිකම් වර්ග කළ හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(vi) සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන නූතන මිනුම් දර්ශක **දෙකක්** දක්වන්න.

(vii) රාජ්‍යයකට ක්‍රියාත්මක කළ හැකි බලයෙහි විවිධ ස්වරූප **දෙකක්** සඳහන් කරන්න.

(viii) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබිය හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ix) නිෂ්පාදිත භාණ්ඩ පාරිභෝගිකයා දක්වා බෙදාහැරීමේ දී අනුගමනය කරන ප්‍රධාන වෙළඳාම් ක්‍රම **දෙක** මොනවා ද?

(x) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 × 10 = 20 යි)

**2.** අර්ථ ක්‍රමයක් යනු මිනිසා මුහුණ දෙන ප්‍රධාන ආර්ථික ප්‍රශ්න විසඳාගැනීම සඳහා විවිධ සමාජ සංවිධානය වී ඇති ආකාරයයි.

(i) භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)

(ii) මිනිස් වුවමනා ඉටු කර ගැනීමේ දී භාවිත කරන ආර්ථික නොවන භාණ්ඩ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගැනීම සඳහා විවිධ සමාජ සංවිධානය වී ඇති ආකාර **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් කරන ලද එක් ආකාරයක මූලික ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**3.** ගැටුම්කාරී චර්යාවන් සහිත පුද්ගලයන් නිසා පවුල තුළ මෙන්ම සමාජය තුළ ද ගැටුම්කාරී තත්ත්ව නිර්මාණය වීම සිදු වේ.

(i) පුද්ගලයන් අතර ඇතිවන වැරදි වටහාගැනීම්වල ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි මානසික තත්ත්ව **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ගැටුමක් ඇති වීමට බලපාන මූලික හේතු **තුන** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) සමථකරණය මගින් විසඳාගත හැකි ගැටුම් සඳහා උදාහරණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) සමථකරණය මගින් ගැටුම් නිරාකරණය කර ගැනීමෙන් පුද්ගලයකුට ලැබිය හැකි වාසියක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

[හයවැනි පිටුව බලන්න.

4. රාජ්‍යයක වගකීම වන්නේ රට තුළ නීතිය හා සාමය පවත්වා ගනිමින් යහපත් සමාජයක් ගොඩනංවා ගැනීම ය.

(i) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ දක්නට ලැබෙන ඉහළ ම අධිකරණ ආයතන **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මහාධිකරණය මගින් විසඳනු ලබන බරපතල අපරාධ ලෙස සැලකෙන වැරදි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) අධිකරණය මගින් යුක්තිය ඉටුකර ගැනීමට විශාල කාලයක්, ශ්‍රමයක් හා මුදලක් වැය කිරීමට සිදු වන නිසා ඇති විය හැකි **අහිතකර** ප්‍රතිඵල **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් කරන ලද අහිතකර ප්‍රතිඵල වළක්වා ගැනීමට පුරවැසියාට ගත හැකි ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

5. "මිනිසුන්ට එකට එක් වී ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් පිහිටුවා ගත් සංවිධානය රාජ්‍යය ලෙස හැඳින්වේ."

(i) රාජ්‍යයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) රාජ්‍යයකට ඉටු කිරීමට පැවරෙන කාර්ය **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) රාජ්‍යයක පුරවැසියා කෙරෙහි වන වගකීම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් කරන ලද වගකීම් නිසා පුරවැසියකුට අත්වන වාසියක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

6. පුද්ගලයන් ජීවත්වන වටපිටාව, සියලු ජීවීන්, ඔවුන් අතර පවතින අන්තර් සම්බන්ධතාව හා එහි පැවැත්මට දායක වන ක්‍රියාකාරකම් පරිසරය ලෙස හැඳින්විය හැකි ය.

(i) ස්වාභාවික පරිසරයට අයත් ප්‍රපංච සඳහා උදාහරණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ස්වාභාවික සංසිද්ධීන් ඇසුරින් භෞතික පරිසරයට සිදුවන හානි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) මිනිස් ක්‍රියාකාරකම් නිසා වායු දූෂණය සිදු වන අවස්ථා **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(*b*) මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරයට සිදුවන හානි වළක්වා ගැනීමට පුරවැසියකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

7. ජාතිය, ජන වර්ගය, ආගම, භාෂාව, ස්ත්‍රී-පුරුෂ භාවය, සමාජ පන්තිය හා දේශපාලන මතය ආදී විෂමතා කිසිවක් නොසලකා පොදුවේ සැමට අයිතිවාසිකම් හිමි විය යුතු වේ.

(i) ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී අවධානය යොමු කරන ලද සුවිශේෂී අරමුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සුභසාධනය සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(*b*) ඔබගේ පවුලේ වැඩිහිටියන් සතුටෙන් තැබීම සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)


* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300





Rs : 300




Rs : 300





Rs : 300





Rs : 300





Rs : 300




Rs : 350




Rs : 300




Rs : 300




Rs : 200





Rs : 200





Rs : 200





Rs : 250





Rs : 250





Rs : 200





Rs : 200




Rs : 200




Rs : 300




Rs : 300




Rs : 200




Rs : 200




Rs : 250




Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


# 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

**මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.**

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE